**ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම  -  2024**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ  අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දින 214 සිට දින 1,095 දක්වා කාලයක් අය නොවී පවතින රු.65,039,660 ක වෙළඳ ලැබිය යුතු දෑ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 09 ප්‍රකාරව හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | අදාල ප්‍රමිතිය ප්‍රකාරව හානි කරන අලාභ සඳහා ඉඩහැරීමක් සිදු කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 64, 65 සහ 66 ඡේද ප්‍රකාරව පාරිතෝෂික වගකීම හඳුනාගැනීමේදී ආයු ගණන ශිල්ප ක්‍රමය හෝ ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය අනුගමනය කල යුතු වුවත් සමාගම ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සමාගමේ සේවය කොට විශ්‍රාම යන සේවකයන් සඳහා පාරිතෝෂික ගාස්තු ගෙවනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුවය. | ප්‍රමිතිය ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ දෛනික කොන්ත්‍රාත් සේවක වැටුප් දෙවතාවක් ගිණුම්ගත වීම හේතුවෙන් වැටුප් හා වේතන වියදම රු.5,704,490 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | වැටුප් හා වේතන ගිණුම් දෙවතාවක් සටහන් වූ දෛනික කොන්ත්‍රාත් සේවකයින්ගේ වැටුප නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව වැටුප් හා වේතන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2024 වර්ෂය වෙනුවෙන් රු.989,079 ක වරිපනම් තක්සේරු වටිනාකමක් ගෙවිය යුතු බවට තක්සේරු වාර්තාව අනුව නිරීක්ෂණය වු නමුත් සමාගම විසින් රු.85,040 ක් පමණක් ගෙවිය යුතු ශේෂය ලෙස හඳුනාගැනීම | වරිපනම් ගාස්තු වැඩිවීම සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම සඳහා අදාල ප්‍රාදේශීය සභාව සමඟ මේ වන විට සාකච්ඡා කරමින් සිටින අතර, එම ආයතනයේ තීරණය ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට | නීතිරීති ප්‍රකාරව කළ යුතු ගෙවීම් සම්බන්ධව අප්‍රමාදව කටයුතු කළ යුතු අතර ගිණුම්වල |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.904,039 කින් වැඩියෙන් ද ගෙවියයුතු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් ද දක්වා තිබුණි. | කටයුතු කරමි. | හෙළිදරව් කිරීම් සහ ගැළපීම් නිවැරදි වටිනාකමට සිදුකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.110,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් හි දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.110,000 ක මුදල අඩුවෙන් සටහන් වීම නිවරදි කරමි. | අදාල සියලු වටිනාකම් ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් මාසය වෙනුවෙන් ගෙවන ලද රු.332,675 ක් වූ වැටුප් හා වේතන ප්‍රවර්ථන වර්ෂයේ වැටුප් හා වේතන ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ප්‍රවර්ථන වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂයට අදාල වැටුප් හා වේතන ශේෂය මෙම වර්ෂයෙන් ඉවත් කර ලාභයට ගැලපීමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | උත්සව අත්තිකාරම් | 174,609 | උත්සව අත්තිකාරම් සම්බන්ධ විස්තරාත්මක උපලේඛන | උත්සව අත්තිකාරම් රු.174,609 සම්බන්ධයෙන් විස්තරාත්මක උප ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි. | උත්සව අත්තිකාරම් විස්තරාත්මක උපලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 1,510,000 | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වලට අදාළ උපලේඛන | අදාල උප ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරමි. | ටෙන්ඩර් තැන්පතු සඳහා විස්තරාත්මක උපලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ ඇතුලත් 2021 සහ 2023 යන වර්ෂයන්ට අදාලව සේවා මධ්‍යස්ථානයෙන් ලැබිය යුතු රු.6,336,262 ක ශේෂයට අදාල කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි. | රු.6,336,262 ශේෂය පිළිබඳව කිසිදු තොරතුරක් නොමැති බැවින් අදාල ලැබිය යුතු ශේෂය පිළිබඳ සොයා බලා ඊට අදාල ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂය තහවුරු කිරීමට අදාල උපලේඛන පවත්වා ගෙන යා යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂවල සිට පැවත එන රු.16,081,469 ක් වූ වෙළඳ ගෙවිය යුතු ශේෂය තහවුරු කිරීම සඳහා වාර්තාවේ දින වන විටත් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | පෙර වර්ෂවල සිට පැවත එන රු.16,081,469 ක ශේෂයට අදාල උප ලේඛණයක් සකස් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් උපලේඛන පවත්වාගෙන යා යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1982 අංක 03 දරන පනතෙන් සංශෝධිත 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 16 සහ 27 වන වගන්ති | සේවායෝජක විසින් එක් එක් මාසයත් සම්බන්ධයෙන් ඊළඟ මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවක දායක මුදල් අරමුදලට ගෙවීමට කටයුතු කළයුතු අතර ප්‍රමාද වී ගෙවන ලද දායක මුදල් සඳහා අධිභාර අය කරනු ලබයි. සමාගම විසින් භාරකාර අරමුදල සඳහා දායක මුදල් ප්‍රමාද වී ගෙවීම මත සමාලෝචිත වර්ෂය තුළදී රු.60,585 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | 2024 වර්ෂයේ ආයතනයට මුදල් ලබා ගැනීමේදී සිදුවූ ප්‍රමාදය, එම වර්ෂයේ සිදු වූ හදිසි ගංවතුර තත්වයන් සහ මාර්ග අවහිරතා මත ගෙවීම් සිදු කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් මෙම අධිභාර ගෙවීමට සිදු විය. ඉදිරියේදී එම ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව නියමිත දිනයන්වලදී දායක මුදල් ගෙවීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 158 (1) (ආ) දරන උප වගන්තිය | යම් බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට, ඒ බදු අයවීමට ඇති දේපළ සහ ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලුම හා සෑම දේපළක්ම තහනමට ගෙන විකිණීමෙන් ඒ බද්ද හා අයකර ගැනීමේ ගාස්තු අයකිරීම පිණිස කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාවට බලය පවතින අතර 2024 හා 2025 වර්ෂයන්ට අදාලව රු.1,730,887 ක වරිපනම් බදු නොගෙවීම හේතුවෙන් චංචල සහ නිශ්චල දේපළ තහනමට ගැනීමේ දැන්වීමක් සමාගමට එරෙහිව එවා තිබුණි. | වරිපනම් ගාස්තු වැඩිවීම සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම සඳහා අදාල ප්‍රාදේශීය සභාව සමඟ මේ වන විට සාකච්ඡා කරමින් සිටින අතර, එම ආයතනයේ තීරණය ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව වරිපනම් ගාස්තු ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | අපද්‍රව්‍ය, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් අනුගමනය කර පාරිසරික බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | පාරිසරික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අදාල සාකච්ඡා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සිදු කර ඇත. ඊට අදාල ආයතනය තුල සිදුකල යුතු ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට කටයුතු කරමි. | පනත හා අදාළ අනෙකුත් රෙගුලාසි ප්‍රකාරව පාරිසරික බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අංක 1/2015 (II) දරන 2022 ජනවාරි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගමේ සභාපති සහ සාමාන්‍යාධිකාරී වෙත හිමි ඉන්ධන ප්‍රමාණය ඉක්මවා පිළිවෙලින් රු.237,915 ක් සහ රු.120,445 ක් වශයෙන් එකතු වටිනාකම වූ රු.358,360 ක ඉන්ධන චක්‍රලේඛයට පටහැනිව සපයා තිබුණි. | සභාපති සහ සාමාන්‍යාධිකාරී වෙත ආයතනයේ රාජකාරී සඳහා ඉන්ධන ලබා දී තිබූ අතර, ඊට පටහැනිව සපයා දී තිබූ ඉන්ධන පිළිබඳව සොයා බැලීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දීමනා ලබාදීමට සහ ඉන්ධන සඳහා ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන | 2024 වර්ෂයේ ආයතනය විසිරුවා හැරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් තිබූ බැවින් ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසිරුවා | මාර්ගෝපදේශ ප්‍රකාරව නියමිත දිනයන්වලදී අදාල ලේඛන |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගෝපදේශයේ 05 වන පරිච්ඡේදය | සැලැස්ම මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙරද, කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළතද වාර්ෂික වාර්ථාව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළතද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවද එලෙස භාරදීමට කටයුතු කර නොතිබුණි. | හැර තිබිණි. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත අදාල සැලසුම් භාර දීමට නොහැකි විය. ඉදිරියේදී අදාල වාර්තා කාල සීමාව තුළ භාරදීමට කටයුතු කරමි. | භාරදීමට කටයුතු කල යුතුය. |
| (උ) | අංක 01/2020 දරන 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මූල්‍ය රෙගුලාසි 756 (6) වගන්තිය | ඉදිරි මුදල් වර්ෂයේ ජනවාරි 15 වන දිනට පෙර අදාළ මුදල් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කිරීමටත් ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 ට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමුකිරීමට කටයුතු කළ යුතු වුවත්, 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමාගම විසින් 2025 නොවැම්බර් 06 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි දිනයන්හී සිදු කොට එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කර එහි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,419,961 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.28,039,032 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,458,993 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් පිරිවැය සහ පරිපාලන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දී මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 12 කින් වැඩි වී ඇති අතර, විකුණුම් පිරිවැය සියයට 31 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 1.6 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 1.9 ක් විය.

සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 17 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ සියයට 29 ක් වීමෙන් එම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 12 කින් පිරිහී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයකට අයත් ලොරි රථයක් අලුත්වැඩියා කටයුතු සඳහා විගණිත දිනය වන විට අවුරුදු 03 මාස 08 ක කාලයක් ගත වී තිබූ අතර අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් මේ දක්වා රු.1,048,865 ක් වැයකර තිබූ නමුත් එහි අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර භාර දීමටත් අදාළ මුදල් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | අදාල ලොරි රථය ඉතා ඉක්මනින් අළුත්වැඩියා කොට භාර දීමට කටයුතු කරනු ලැබේ. | නියමිත දිනයන්වලදී අදාළ අළුත්වැඩියා කටයුතු නිම කිරීමටත්, ඊට අදාළ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය සංස්ථාවකට අයත් පෙජරෝ රථයක් අලුත්වැඩියා කටයුතු සඳහා 2022 වර්ෂයේදී සමාගම වෙත ලැබී තිබූ අතර එහි අලුත්වැඩියා කටයුතු බාහිර කොන්ත්‍රාත්කරුවකු මගින් ගිවිසුම්ගත වීමකින් තොරව සිදු කරගෙන රු.1,763,300 ක් ගෙවා තිබුණි. එම අළුත්වැඩියාවේදී එකඟ වූ පාට වෙනස් වීම හේතුවෙන් වාහනයේ හිමිකරු එය ලබා ගැනීම ප්‍රතික්ෂේප කර තිබීම මත විගණිත දිනය වන 2025 නොවැම්බර් 06 දින වන විටත් එම වාහනය අයිතිකරුට භාර දී අළුත්වැඩියා වියදම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | වැව්ලි සංස්ථාවට අයත් එම රථය නිවැරදි ආකාරයෙන් පින්තාරු කර අදාල ආයතනය වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. | බාහිර කොන්ත්‍රාත්කරුවන් මගින් සේවා ලබා ගැනීමේදී ගිවිසුම් සහ අදාළ රීති අනුව අදාළ සේවාවන් ලබා ගැනීමටත් නියමිත දිනයන් වලදී අයිතිකරුවන් වෙත භාරදී අදාළ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | රජයේ පාසලකට අයත් වෑන් රථයක් සමාගම විසින් අළුත්වැඩියා කර තිබූ අතර මෙම අළුත්වැඩියාව සඳහා අනුග්‍රාහකයකු විසින් ගෙවන ලද රු.150,000 ක මුදලක් සමාගමේ කර්මාන්ත ඉංජිනේරුවරයා විසින් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන පෞද්ගලික ගිණුමට බැර | මේ පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සමාගමට ලැබිය යුතු මුදල් නිළධාරීන්ගේ පුද්ගලික ගිණුම්වලට බැර නොවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරගෙන තිබූ අතර එම වටිනාකම ඔහු සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ගෙවිය යුතු පාරිතෝෂික මුදලින් 2026 ජනවාරි අයකර ගෙන තිබුණි. | | |
| (ඈ) | රජයේ පාසලකට අයත් වෑන් රථය සමාගම විසින් අලුත්වැඩියා කටයුතු සිදුකර 2024 මාර්තු 27 දින පාසල වෙත භාරදී තිබුණද සමාගමත් පාසලත් අතර කිසිදු මූල්‍යමය හෝ වෙනත් ගිවිසුමක් නොමැති බැවින් එම වටිනාකම ගෙවීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණි. ඒ අනුව අලුත්වැඩියාව වෙනුවෙන් සමාගමට ලැබිය යුතු රු.1,239,530 ක වටිනාකම අයකර ගැනීමට විගණිත දිනය වන 2025 නොවැම්බර් 06 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයට අළුත්වැඩියා කර ලබා දී තිබූ රථයේ බිල්පත් වටිනාකම ලබා ගැනීම පිළිබඳ ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අධ්‍යක්ෂක මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ගනුදෙනුකරුවන් සමඟ විධිමත් එකඟතාවයකින් අලුත්වැඩියා කටයුතු සිදු කල යුතු අතර ඉන්වොයිස් ප්‍රමාදයකින් තොරව භාර දිය යුතුය. එසේම ආයතනයට අය විය යුතු මුදල් අප්‍රමාදව ලබා ගැනීමටද කටයුතු කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස 2 ක තුල සේවයට වාර්තා කරන ලද දින ගණන පමණක් පදනම් කර ගනිමින් සමාගමේ සේවකයින් 73 ක් සඳහා විධිමත් අනුමැතියකින් තොරව 2024 වර්ෂය සඳහා රු.1,400,000 ක දිරි දීමනා ගෙවා තිබුණි. | නිසි දිරි දීමනා ක්‍රමවේදයක් සකසා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | දිරි දීමනා ක්‍රමවේදයක් සකස් කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව දිරි දීමනා නොගෙවිය යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ආරම්භ කර තිබූ සමාගමේ වාහන සේවා මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ ආදායම රු.10,945,007 ක් වූ අතර ඒ සඳහා දරන ලද වියදම රු.12,320,126 ක් වීමෙන් එහි අලාභය රු.1,375,119 වී තිබුණි. එමෙන්ම 2024 ජූනි සිට මෙම සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු නවතා තිබූ අතර ඒ අනුව රු.11,407,706 ක් වටිනා යන්ත්‍ර උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | වාහන සේවා මධ්‍යස්ථානයේ කටයුතු නිසි ක්‍රමවේදයකට අනුව ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේ ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නියමිත ක්‍රමවේදයකට අනුකූලව මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ කාර්ය මණ්ඩලය 2018 වර්ෂයේදී අනුමත කර ගෙන තිබුණ ද එම වර්ෂයේ සිට මේ දක්වා වසර 07 ක් කල් ගත වී ඇතත් සමාගම විසින් සේවකයන් බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමට කටයුතු කරමි. | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමේ තනතුරු 28 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 121 ක් වන අතර ඉන් ඉහළ කළමනාකරණ මට්ටමට අයත් සාමාන්‍යාධිකාරී, පරිපාලන නිලධාරී හා අභ්‍යන්තර විගණක යන තනතුරු බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වූ 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර ගණකාධිකාරී තනතුර 2021 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතී. මෙම තත්ත්වය සමාගමේ අභ්‍යන්තර පාලනයටද දැඩි ලෙස බලපා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් දිනය වනවිට සේවකයන් 45 දෙනෙකුගේ ඌණතාවයක් පැවතුණි. | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමෙන් පසු අදාල බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. | කඩිනමින් බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරවා ගැනීමටත් ඒ අනුව අදාළ බඳවා ගැනීම් සිදු කිරීමටත් කටයුතු කළ යුතුය. |